# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2071/10 - 2018 මැයි මස 15 වැනි අඟහරුවාදා - 2018.05.15**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### 1980 අංක 44 දරන ඡන්දහිමියන් ලියාපදිංචි කිරීමේ පනත

2018 වර්ෂය සඳහා ඡන්දහිමි නාමලේඛන ප්‍රතිශෝධන කටයුතු 2018 මැයි මස 15 වන දින ආරම්භ කරන බව 1980 අංක 44 දරන ඡන්දහිමියන් ලියාපදිංචි කිරීමේ පනතේ 12(1) වගන්තිය අනුව මෙයින් දැනුම් දෙනු ලැබේ.

02. දැනට වලංගුව පවතින ඡන්දහිමි නාමලේඛනවල හෝ ඒවායේ කොටස්වල පිටපත් ලියාපදිංචි කිරීමේ නිලධාරී විසින් ස්වකීය කාර්යාලවලදී සහ පහත දැක්වෙන කාර්යාලවලදී ප්‍රදර්ශනය කරනු ඇත.

| *නාමලේඛනවල හෝ ඒවායේ කොටස්වල පිටපත් ප්‍රදර්ශනය කරනු ලබන කාර්යාල* | *ප්‍රදර්ශනය කරනු ලබන නාමලේඛන හෝ ඒවායේ කොටස්* |
|---|---|
| කොළඹ දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය (කොළඹ දිස්ත්‍රික්කයේ, මහ නගර සභා බල ප්‍රදේශ) අංක 395, පරණ කෝට්ටේ පාර, රාජගිරිය. | කොළඹ දිස්ත්‍රික්කයේ, මහ නගර සභා බල ප්‍රදේශවල පදිංචිව සිටින සියලුම ඡන්දහිමියන්ගේ නම් ඇතුළත් ඡන්දහිමි නාමලේඛන කොටස. |
| කොළඹ දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය, අංක 395, පරණ කෝට්ටේ පාර, රාජගිරිය. | කොළඹ දිස්ත්‍රික්කයේ, මහ නගර සභා බල ප්‍රදේශය හැර ඉතිරි ප්‍රදේශවල පදිංචිව සිටින සියලුම ඡන්ද හිමියන්ගේ නම් ඇතුළත් ඡන්ද හිමි නාමලේඛන කොටස. |
| එක් එක් දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය | මැතිවරණ කොට්ඨාසයට අදාළ ඡන්දහිමි නාමලේඛනයේ සම්පූර්ණ පිටපත. |
| එක් එක් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | අදාළ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ සාමාන්‍ය පදිංචිය සනාථවන ඡන්දහිමියන්ගේ නම් ඇතුළත් ඡන්දහිමි නාමලේඛන කොටස. |
| එක් එක් පළාත් පාලන ආයතනය | එක් එක් පළාත් පාලන ආයතනයේ බල ප්‍රදේශය තුළ සාමාන්‍ය පදිංචිය සනාථවන ඡන්දහිමියන්ගේ නම් ඇතුළත් ඡන්දහිමි නාමලේඛන කොටස. |
| එක් එක් ග්‍රාම නිලධාරී කාර්යාලය | අදාළ ග්‍රාම නිලධාරී කොට්ඨාසය තුළ සාමාන්‍ය පදිංචිය සනාථවන ඡන්දහිමියන්ගේ නම් ඇතුළත් ඡන්දහිමි නාමලේඛන කොටස. |

03. යම් මැතිවරණ කොට්ඨාසයක ඡන්ද හිමියකු වීමට සුදුසුකම් ඇති සෑම තැනැත්තෙකුම සිය නම වලංගු ඡන්දහිමි නාමලේඛනයේ තිබේ දැයි පරීක්ෂා කර බැලීමට ක්‍රියා කළ යුතු වේ.

04. 2018 වර්ෂය වෙනුවෙන් ඡන්දහිමියන් වශයෙන් ලියාපදිංචි කිරීම සඳහා සුදුසුකම් ඇති පුද්ගලයන්ගේ විස්තර ලබා ගැනීම සඳහා ඡන්දහිමියන් ගණන් ගන්නා නිලධාරීන් විසින් ගෘහ මූලිකයන් වෙත අදාළ ඡන්දහිමියන් ගණන් ගැනීමේ ආකෘතිපත් 2018.05.15 වන දින සිට නිකුත් කරනු ලැබේ. ගෘහ මූලිකයින් විසින් සම්පූර්ණ කරනු ලබන ආකෘතිපත් ආපසු එකතු කිරීමේ කටයුතු 2018 ජූනි මස 01 දින සිට සිදුකරනු ලැබෙනු ඇත. ස්වකීය ගෘහය යටතේ ඡන්දහිමියන් වශයෙන් ලියාපදිංචි වීමට සුදුසුකම් ලබන සියළු දෙනාට අදාළ අත්‍යවශ්‍ය තොරතුරු නිවැරදිව, අප්‍රමාදව ගණන් ගැනීමේ ආකෘති මගින් සැපයීමෙන්, ඡන්ද හිමියන් ගණන් ගන්නා නිලධාරීන්ට සහායවන ලෙස සියලුම ගෘහ මූලිකයන්ගෙන් මැතිවරණ කොමිෂන් සභාව ඉල්ලුම්කර සිටියි.

මහින්ද දේශප්‍රිය
සභාපති,
මැතිවරණ කොමිෂන් සභාව.

එන්. ජේ. අබේසේකර
සාමාජික,
මැතිවරණ කොමිෂන් සභාව.

එස්. රත්නජීවන් එච්. හූල්
සාමාජික,
මැතිවරණ කොමිෂන් සභාව.

2018 මැයි මස 15 වැනි දින,
මැතිවරණ මහලේකම් කාර්යාලය,
සරණ මාවත,
රාජගිරිය.

06 - 28

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.